## ආපසු මුදල්

පහත දක්වෙන කොන්දේසි වලට යටත්ව ඔබේ ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්පත භාවිතා කරමින් සිදුකරන රුපියල් 300/- ක සෑම ගනුදෙනුවක් සඳහා ශ්‍රී ලංකා රුපියලක (රු.1/-) ආපසු ගෙවන මුදලක් ලබා ගැනීමට ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්පත් සාමාජිකයකුට හිමිකම් ලැබේ.

1. කාඩ්පත් සාමාජිකත්වයට සම්බන්ධවූ දිනයේ සිට ආරම්භ වන පරිදි ඔහු/ඇය රු. 60,000/- ක සමුච්චිත වැයක් සිදු කිරීමෙන් අනතුරුව ආපසු ගෙවන මුදල් ඉල්ලුම් කිරීමට කාඩ්පත් සාමාජිකයාට හිමිකම් ලැබේ ආපසු මුදල් ගෙවන ලෙස ඉල්ලා සිටීමට කාඩ්පත් සාමාජිකයාට අවම වශයෙන් රු. 200/- ක ආපසු ගෙවන මුදලක් තිබිය යුතුය.

2. සිදුකරන ලද යම් ශේෂ පැවරුම් මුදල මත ගෙවන ලද යම් මුදල් අත්තිකාරම්, පොළී ගෙවීම් හෝ ගාස්තු සඳහා ආපසු ගෙවන මුදල් ප්‍රදානය කරනු නොලැබේ. ශේෂ පැවරුම් යනු එක් බැංකුවකින් තවත් බැංකුවකට, පරිශේෂගත කාඩ්පත් ශේෂය පැවරීමයි.

3. කාඩ්පත් සාමාජිකයාගේ ගිණුමට පසුව නැවත බැරකරන ලද යම් මුදල් ප්‍රමාණයන් "ආපසු ගෙවන මුදල්" උපයාගැනීමට සුදුසුකම් නොලබයි.

4. යුතුකම් පැහැර නොහරින කාඩ්පත් සාමාජිකයින්ට පමණක් ආපසු ගෙවන මුදල් ගෙවනු ලැබේ. මාසික පදනමක් මත බැංකුවට (යටත් පිරිවැයෙන් නියමිත අවම මුදලවත්) කාඩ්පත් සාමාජිකයා විසින් අඛණ්ඩව ගෙවන විට යුතුකම් පැහැර නොහරින තත්වය පවතී.

5. ආපසු ගෙවන මුදල සංශෝධනය කිරීමට, ප්‍රතිශෝධනය කිරීම හෝ නතර කිරීමට බැංකුව අයිතිය රඳවා ගනී.